**B කොටස - රචනා**

- ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

  අවශ්‍ය තැන්හි දී නම් කරන ලද පැහැදිලි රූප සටහන් දෙන්න.

  (එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 15 කි)

05. (a) මයිටකොන්ඩ්‍රියාවක සූක්ෂම ව්‍යුහය විස්තර කරන්න.

    (b) මයිටකොන්ඩ්‍රියාවක් තුළට ඇතුල්වන පයිරුවික් අම්ල අණුවකට අත්වන ඉරණම විස්තර කරන්න.

06. (a) බීජ නොදරන සනාල ශාකවල වැදගත් ලක්ෂණ කෙටියෙන් විස්තර කරන්න.

    (b) Anthophyta ශාක වල ආහාර පරිසංක්‍රමණය කරනු ලබන පටකයේ දික්කඩක ව්‍යුහය දක්වන නම්කළ රූප සටහනක් ඇඳ ආහාර පරිසංක්‍රමණ ක්‍රියාවලියේ යාන්ත්‍රණය පිළිබඳව පිළිගත් කල්පිතය කෙටියෙන් විස්තර කරන්න.

07. (a) සත්ත්ව රාජධානියේ අපෘෂ්ඨ වංශීන්ගේ හමුවන ස්නායු පද්ධතිවල විවිධත්වය විස්තර කරන්න.

    (b) මානව සමේ ඇති සංවේදී ප්‍රතිග්‍රාහක නම් කර ඒවායේ කාර්ය භාරය පැහැදිලි කරන්න.

08. (a) මිනිසාගේ පෙනහැලි වාතනය වීමේ යාන්ත්‍රණය පැහදිලි කරන්න.

    (b) රුධිරය හා වාතය අතරත් රුධිරය හා පටක අතරත් වායු හුවමාරු ක්‍රියාවලිය විස්තර කරන්න.

09. (a) මානව ඩිම්භ කෝෂයේ ව්‍යුහය කෙටියෙන් විස්තර කරන්න.

    (b) අණ්ඩෝද්භවය හා එහි හෝමෝන යාමනය සිදුවන ආකාරය පැහැදිලි කරන්න.

10. කෙටි සටහන් ලියන්න.

    (a) සරල අපිච්ඡද පටක.

    (b) $K^+$ ස්‍යන්දය.

    (c) අසම්පූර්ණ ප්‍රමුඛතාවය.

* * *